මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025 -2029

අන්තර්ගතය

1. **හැඳින්වීම** 1
2. **ණය කළමනාකරණ අරමුණ සහ විෂය පථය** 2
3. **මෑතකාලීන සාර්ව මූල්‍ය විකාශනය** 2
4. **ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන හා එයින් ණය තිරසාරත්වය කෙරෙහි වූ බලපෑම** 3
5. **ණය තිරසාරත්වය සඳහා වූ ඉලක්ක** 4
6. **මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුව** 5
7. **වර්තමානයේ පවතින ණය කළඹ විශ්ලේෂණය කිරීම** 5
   - 7.1 ණය උපකරණ අනුව හිඟ ණය 7
   - 7.2 වත්මන් ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම 8
   - 7.2.1 ණය පිරිවැය 9
   - 7.2.2 ප්‍රතිමූල්‍යකරණ අවදානම 9
   - 7.2.3 පොලී අනුපාත අවදානම 9
   - 7.2.4 විනිමය අනුපාත අවදානම 10
   - 7.3 ණය පියවීමේ පැතිකඩ 10
8. **ප්‍රධාන පිරිවැය සහ අවදානම් ඉලක්ක** 11
9. **මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029** 12
   - 9.1 උපකල්පන 12
   - 9.2 උපාය මාර්ග 13
   - 9.3 දළ ණය ගැනීමේ ප්‍රතිශතයේ ව්‍යාප්තිය 14
   - 9.4 එක් එක් උපාය මාර්ගයන්හි පිරිවැය සහ අවදානම් විශ්ලේෂණය 14
10. **2025-2029 සඳහා අභිමත උපායමාර්ගය සහ එහි බලපෑම** 17
11. **අභිමත උපායමාර්ගය හා සම්බන්ධිත අවදානම හා අවදානම අවම කිරීමේ යාන්ත්‍රණය** 19
12. **නිගමනය** 21

රූප සටහන්

රූප සටහන 1: රජයේ ණය තොගය සහ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය..... 8
රූප සටහන 2: ණය උපකරණය අනුව හිඟ ණය..... 9
රූප සටහන 3: ණය පියවීමේ පැතිකඩ 12
රූප සටහන 4: දළ ණය ගැනීමේ ප්‍රතිශතයේ ව්‍යාප්තිය.....16

වගු සටහන්

වගුව 1 : පවතින ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම..... 10
වගුව 2: ප්‍රධාන පිරිවැය සහ අවදානම් ඉලක්ක 16
වගුව 3: එක් එක් උපාය මාර්ගයන්හි පිරිවැය සහ අවදානම් දර්ශක.....17

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය (MTDS 2025-2029)

1. හැඳින්වීම

2024 වසරේ ජුනි මස 18 දින සම්මත කරන ලද එමෙන්ම 2024 වසරේ නොවැම්බර් මස 25 වන දින සිට බලාත්මක වූ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත (PDMA) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය සඳහා එලදායී රාමුවක් සපයයි. රාජ්‍ය ණය කළමනාකරණ පනත මගින් මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට (MTFF) අනුකූලව මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයක් (MTDS) සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වී ඇත. එය සැකසීමේදී සාර්ව ආර්ථික හා මූල්‍ය වෙළඳපළ තත්වයන්ටත්, වත්මන් රාජ්‍ය ණය කළඹෙහි ඇතුළත් කර ඇති පිරිවැය සහ අවදානමත්, විවිධ ණයහිමියන්ගෙන් මූල්‍යකරණය ලබා ගැනීමේ හැකියාව සහ අනාගත මූල්‍යකරණ අවශ්‍යතා මෙන්ම ණය සේවා පිරිවැයට එල්ල විය හැකි අවදානමත් යන කරුනු සැලකිල්ලට ගනු ඇත. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයෙහි විෂය පථය රජයේ ණය සඳහා පමණක් සීමා වේ.

2025 වසරේ සිට 2029 වසර දක්වා වන වසර පහ (05) ආවරණය වන පරිදි වූ මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය (MTDS 2025-2029) රජයේ ණය කළමනාකරණය සඳහා වන සැලැස්මක් මෙන්ම එය රාජ්‍ය ණය කළමනාකරණ අරමුණුවලට අනුකූල වන රජයේ අපේක්ෂිත ණය කළඹ අත් කර ගැනීමද පෙරදැරි කර ගෙන ඇත. එමගින් ස්ථාපිත පිරිවැය සහ අවදානම් අරමුණු සන්දර්භයට අනුකූලව සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය පියවීම සඳහා වන රජයේ ණය ගැනීමේ තීරණවලට මඟ පෙන්වයි. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය වාර්ෂිකව සමාලෝචනය කරමින් 2025 වසරේ නොවැම්බර් මස වන විට උපායමාර්ගය සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබේ.

2023 වසරේ සිට ඇති වූ ගැඹුරු ආර්ථික අර්බුදයෙන් පසු අපේක්ෂා කළ වේගයට වඩා සාර්ව ආර්ථික තත්ත්වයන් අවසානයේ ස්ථාවර වී ඇත. පිරිවැය පිළිබිඹු වන ලෙස සකස් කළ උපයෝගිතා මිලකරණය, නව ආදායම් සඳහා වන ක්‍රියාමාර්ග, විවක්ෂණශීලී වූ මුදල් ප්‍රතිපත්තියට නැවත ලගාවීම මෙන්ම දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළුව 2022 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ තුලින් , සාර්ව ආර්ථික හා මූල්‍ය ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සහ රටේ අනාගත වර්ධනය පිළිබඳ විශ්වාසය ශක්තිමත් කිරීමට වැදගත් වී ඇත.දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සාර්ථක ලෙස අවසන් කර ඇත. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, ඇතැම් නිල ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ සාකච්ඡා දැනට අවසන් අදියරේ පවතී. පොලී අනුපාත තියුණු ලෙස පහත යෑමෙන් රජයේ ණය ගැනීම සඳහා දේශීය වෙළඳපළට ප්‍රවේශවීම යථා තත්වයට පත් කර තිබේ. එය රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වන තිරසාර මූල්‍යකරණයක් ලගාකර ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වනු ඇත. විදේශීය වෙළඳපොළට ප්‍රවේශ වීමද මධ්‍ය කාලීනව යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂිතය.

2023 වසරේ සහ 2024 වසරේ දී වාර්තා වූ ප්‍රාථමික ගිණුමේ අතිරික්තය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් 2022 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 114.2 ක ඉහලම අගයක සිට 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 98 ක අගයක් දක්වා රාජ්‍ය ණය අඩු වී ඇත. පවතින දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපළ තත්ත්වයන් තුළ ක්‍රියාත්මක කළ හැකි පිරිවැය සහ අවදානම් ඇඟයීම මත සකස් කළ විකල්ප ණය උපාය මාර්ග හතර (4) අනුව 2025-2029 මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සකස් කරන ලදී. මෙම ක්‍රියාවලිය තුළින් තෝරාගත් ණය උපාය මාර්ගය මගින් ණය කල්පිරීමේ සාමාන්‍ය කාලය දීර්ඝ කිරීමත්, ස්ථාවර පොලී අනුපාත උපකරණ හරහා ණය ගැනීම් වැඩිකිරීම සහ දේශීය ණය ගැනීම් වැඩි කිරීමත් අරමුණු කරයි.

2. ණය කළමනාකරණ අරමුණ සහ විෂය පථය

රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 3 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු පහත පරිදි වේ:

1. මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ ණය ගෙවීමේ වගකීම් කාලානුරූපීව පියවීම
2. මධ්‍යකාලීන සිට දිගුකාලීන දක්වා වන කාලය තුළ විවක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුකූලව හැකිතාක් අවම පිරිවැයක් යටතේ ණය ගැනීම සහ
3. දේශීය ණය සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

2025-2029 මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය යනු රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීමෙන් පසු 2024 වසරේ දෙසැම්බර් මස 02 වන දින සිට ක්‍රියාත්මක වූ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ (MoF) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) විසින් සකස් කරන ලද පළමු උපාය මාර්ගයයි. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) විවිධ දෙපාර්තමේන්තු වෙන් වෙන්ව විසිරී කළ සියලු ණය පිළිබඳ කාර්යයන් ඒකාබද්ධව ඉටු කිරීම සඳහා අදාල ආයතනයන් විසින් එම කාර්යයන් ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නිරත වෙමින් සිටින අතර, 2025 දෙසැම්බර් මස අවසානය වන විට එය සම්පූර්ණ ලෙස ස්ථාපිත කර අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025-2029 රජයේ මූල්‍ය අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ගික මාර්ග සිතියමක් සපයන අතර, ණය මට්ටම් ස්ථාවර මෙන්ම තිරසාරව පවතින බවට සහතික කරමින් වඩාත්ම ලාභදායී ණය ගැනීම් සාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාවය ද අවධාරණය කරයි. 2025 වසරේ රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග වාර්තාවේ සහ 2025 මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැයේ දක්වා ඇති පරිදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව උපාය මාර්ගය සකස් කරන ලද අතර, එයට සාර්ව ආර්ථික උපකල්පන සහ මධ්‍ය කාලීන මූල්‍ය ඉලක්ක ඇතුළත් වේ. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ දක්වා ඇති ණය ඌනකරණය කිරීමේ ඉලක්ක සහ ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක සමඟ ද මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය අනුකූල වේ.

3. මැතකාලීන සාර්ව මූල්‍ය විකාශනය

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ද්විත්ව අගයකින් අයවැය හිඟය 2020, 2021 සහ 2022 වසර වලදී පිළිවෙලින් සියයට 10.7, සියයට 11.7 හා සියයට 10.2 ලෙස වාර්තා වූ අතර එය දුර්වල රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කරමින් 2021 වසරේ දී ජාතික ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.3 ක ප්‍රතිශතය දක්වා වාර්තාගත ලෙස අඩු විය. ඒ අනුව, මෙම සෑම වර්ෂයකදීම අයවැය හිඟය පියවීම සඳහා අමතර ණය ගැනීම් සිදුකිරීම තුලින් නිරපේක්ෂ අගය මත රාජයේ ණය ප්‍රමාණයේ ප්‍රමාණාත්මක ඉහල යාමක් සිදු වී ඇත.

Moody's, Fitch සහ S&P ආයතන විසින් සිදුකල ණය ශ්‍රේණිගත කිරීම පහත හෙලීමට සමගාමීව ශ්‍රී ලංකාව 2020 වසරේ සිට ගෝලීය ප්‍රාග්ධන වෙළඳපොල සඳහා ප්‍රවේශ වීමට නොහැකි වූ අතර ඒ තුලින් 2022 වසරේ අප්‍රේල් මාසය වන විට භාවිතා කල හැකි සංචිත වටිනාකම ආසන්න වශයෙන් ශූන්‍ය අගයක් දක්වා රටේ විදේශ විනිමය සංචිත ඒකාකාරව පහත වැටීමකට ලක්විය. සෘන වෙළඳ ශේෂය සහ ජංගම ගිණුම් ශේෂයද දල නිල සංචිත (Gross Official Reserve) අඩුවීමේ බලපෑමට ලක්විය. 2019

වසරේ සිදු වූ පාස්කු ප්‍රහාරය සහ පසු කාලීන කොවිඩ් 19 වසංගතය පැතිරීමද තුලින් සංචාරක ආදායම සැලකිය යුතු ලෙස අඩුවීමකට ලක්විය.

මෙම තත්වය සඳහා ප්‍රතිචාරයක් ලෙස, 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින රජය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් සහය දැක්වූ ආර්ථික ගැලපුම් වැඩසටහනට අනුකූලව නිසි සම්මුතියකට අනුව ණය ප්‍රතිව්‍යුහගතකරණයට යටත්ව, ශ්‍රී ලංකාවේ ඒක පාර්ශ්වීය සහ විදේශීය ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමක් ක්‍රියාත්මක කරන ලදි.

මෙම ආර්ථික ව්‍යසනයට හේතු පාදක වූ කරුණු සම්බන්ධයෙන් නිසි විසඳුමක් ලබාදීම සඳහා රජය විසින් 2022 වසරේ අප්‍රේල් මාසයේදී සාර්ව ආර්ථික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වසරේ අප්‍රේල් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමග සාකච්ඡා කිරීම අරඹන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ මූල්‍ය පහසුකම යටතේ ශ්‍රී ලංකා රජය විසින් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, මූල්‍ය ප්‍රතිසංස්කරණ, නීති සම්පාදනයෙහි වූ පරිවර්තනයක්, දූෂණ විරෝධී ක්‍රියා මාර්ගයන්, ණය තිරසාරත්වය සඳහා වූ ක්‍රියා මාර්ගයන්, පිරිවැය ආවරණය මත මිල ක්‍රම, මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම යන කරුණු තුලින් සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ ආර්ථික වර්ධනය ඇති කිරීම සම්බන්ධයෙන් සාධනීය ක්‍රියාමාර්ග ලබාගෙන ඇත.

නීති සම්පාදනයෙහි වූ පරිවර්තනය තුලින් පෙර අත්දැකීම් හා උගත් පාඩම් අනුව නව නීති හඳුන්වාදීම සහ පවත්නා නීති සංශෝධනය කිරීමට කටයුතු සිදු කර ඇත. මෙම නීති සම්පාදනය, විධායක සහ පරිපාලන ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඉලක්ක ගත කරගෙන ක්‍රියාත්මක කළ අතර අළුතින් පනවන නව නීති මගින් රාජ්‍ය මූල්‍ය, ප්‍රසම්පාදනය, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය, රාජ්‍ය ව්‍යවසායන්, රාජ්‍ය ණය කළමනාකරණය, මුදල් ප්‍රතිපත්තිය ස්ථාවර කිරීම, අක්වෙරල ආර්ථික කටයුතු යන ක්ෂේත්‍රයන් ආවරණය කර ඇත.

මෙම පුළුල් ප්‍රවේශය, පාලන ව්‍යුහය නව්‍යකරණය කිරීම සහ විනිවිදභාවය හා වගවීම වැඩිදියුණු කිරීම සඳහා වන කැපවීම අවධාරණය කරයි. මෙම යෝජිත නීති සහ ආර්ථික ප්‍රතිසංස්කරණ, ක්‍රමිකව විකාශනය වන පාලන සහ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් තුලින් වර්තමාන තත්වය, වඩා ඉහල කාර්යක්ෂමතාවයක් හා ඵලදායීතාවයකින් යුතු පාලන හා ආර්ථික කළමනාකරණ පද්ධතියක් ලෙස ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී ප්‍රවේශයක් ලබා දේ. එසේම මෙම ප්‍රතිසංස්කරණ, ආර්ථික විශ්වාසනීයත්වය නැවත ගොඩනැගීමට, දූෂන අවධානම් අඩු කිරීම, ආර්ථික වර්ධනය වඩා ශක්තිමත් කිරීමට සහ සමානාත්මක කිරීම සඳහා මූලික වනු ඇත.

4. ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන හා එයින් ණය තිරසාරත්වය කෙරෙහි වූ බලපෑම

2022 වසරේ අප්‍රේල් මස 12 වන දින ප්‍රකාශයට පත්කරන ලද ණය සේවා ගෙවීම් අත්හිටුවීමේ අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව, ශ්‍රී ලංකා රජය සඳහා මූල්‍ය හා නීති උපදේශකයින්, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් තෝරාගෙන ලාංකික බලධාරීන් සමඟ එක්ව ශ්‍රී ලංකාවේ විදේශ ණය හිමියන් සමග ණය ප්‍රතිව්‍යුහගතකරණ යෝජනා ක්‍රමයක් සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදි.

ජපානය, ඉන්දියාව සහ ප්‍රංශය සම සභාපතිත්වය දරන නිල ණය හිමියන්ගේ කමිටුවේ (OCC) සාමාජිකයන් 17 දෙනාත්, චීන ආනයන අපනයන බැංකුව ඇතුළු ද්වී පාර්ශ්වීය ණයහිමියන් සමඟ සාකච්ඡා කරමින් අදාල ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ශ්‍රී ලංකාව එකඟතාවයකට එළඹියේය. ණය සහනය ලෙස ගෙවීම් කල් දැමීම මුළු මුදල සඳහා වන සහන කාලසීමා සහ පොලී අනුපාත අවප්‍රමාණයන්

ඇතුලත් විය. වසරක කාලයක් පුරා පැවති සාකච්ඡා වලින් අනතුරුව 2024 වසරේ ජුනි මස 24 වන දින නිල ණය හිමියන්ගේ කමිටුව (OCC) සමග අවබෝධතා ගිවිසුමක් හා චීන ආනයන අපනයන බැංකුව සමග ණය_පිළියම් කිරීමේ (Debt Treatment) ගිවිසුමක් අත්සන් කරන ලදි.

ඇ. ඩො. බිලියන 12.55 ක් වූ ජාතයන්තර ස්වෛරී බැදුම්කර (ISB) ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ශ්‍රී ලංකාවට පහත සහන ලැබේ.

- ආර්ථික පහත වැටීමකදී ඇ.ඩො.බිලියන 4.9 දක්වා වැඩිවිය හැකි සහ ආර්ථිකය සැලකිය යුතු වශයෙන් වැඩිදියුණු වුවහොත් ඇ.ඩො.බිලියන 2.6 දක්වා අඩුවිය හැකිවන පරිදි ඇ.ඩො. බිලියන 3.7 ක ඉදිරි ණය අඩු කිරීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් කාලය (වසර 4) තුල ඇ.ඩො. බිලියන 9.6 ක ණය සේවා ගෙවීම් අඩු කිරීම
- ශ්‍රී ලංකාවේ බැදුම්කර පොලී අනුපාතය සියයට 33 කින් අඩුකර සියයට 4.4 ක ප්‍රතිශතයක් දක්වා ගෙන ඒම
- සාමාන්‍ය කල්පිරීමේ පැතිකඩ (average maturity profile) අවුරුදු 5ක් දක්වා දීර්ඝ කිරීම

ශ්‍රී ලංකාව 2024 වසරේ දෙසැම්බර් මස 24 වන දින චීන සංවර්ධන බැංකුව (CDB) සමඟ වන වගකීම් සඳහා අවශ්‍ය එකඟතාවයන් සහ ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු නිමකරන ලදි. ඒ අනුව සියළු ප්‍රමාණාත්මක බාහිර ණය සාර්ථකව ප්‍රතිව්‍යුහගතකරණය සිදුකර ඇත. ඉතිරි වූ කුඩා වාණිජ ණය (HSBC/ ICBC) ප්‍රතිව්‍යුහගතකිරීම අවසන් අදියරේ පවතී.

නිල ණය හිමියන්ගේ කමිටුවට (OCC) ඇතුලත් නොවූ කුඩා ද්විපාර්ශවීය ණය හිමියන් (කුවේට්, සෞදි අරාබිය, ඉරානය, පකිස්තානය) සමග වන ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම්ද අවසන් කරමින් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය ණය වලට අමතරව ශ්‍රී ලංකා ගුවන් සමාගම මගින් නිකුත් කල ඇ.ඩො.මිලියන 175 ක බැදුම්කරද ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට නියමිතය.

ඒ අනුව ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන් කාලය තුල සමස්ථ වශයෙන් ඇ.ඩො.බිලියන 17 ක් වූ ණය සේවා සහනයක් ලබාගෙන ඇත. (චීන ආනයන අපනයන බැංකුව - ඇ.ඩො.බිලියන 2.4, නිල ණය හිමියන්ගේ කමිටුව - ඇ.ඩො.බිලියන 2.9, චීන සංවර්ධන බැංකුව ඇ.ඩො.බිලියන 2.5, බැදුම්කර හිමියන් - ඇ. ඩො. බිලියන 9.5)

5. ණය තිරසාරත්වය සඳහා වූ ඉලක්ක

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් (IMF) සිදුකරන ලද ශ්‍රී ලංකාවේ ණය තිරසාරත්ව විශ්ලේෂණය (Debt Sustainability Analysis) අනුව රටේ ණය තිරසාරත්වය නැවත ඇතිකිරීම සඳහා පහත ඉලක්කයන් ක්‍රියාත්මක කල යුතුය.

1. 2032 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය (Deb to GPD ratio) 95% ට අඩු කිරීම
2. 2027 වසරේ සිට 2032 වසර තෙක් මධ්‍යම රජයේ වාර්ෂික දල මූල්‍යකරණ අවශ්‍යතා දළ දේශීය නිෂ්පාදිතයෙන් 13% ප්‍රතිශතයකට අඩු කිරීම

3. 2027-2032 අතර මධ්‍යම රජයේ විදේශ ණය සේවා ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.5% ප්‍රතිශතයකට අඩු කිරීම
4. ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම (IMF-EFF) වැඩසටහන යටතේ ඇ.ඩො.බිලියන 17 ක ගෙවුම් ශේෂ හිඟය අවසන් කිරීම

6. මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුව

ණය තිරසාර ඉලක්ක කරා ලඟා වීම සාක්ෂාත් කර ගැනීම සඳහා, රජයේ ආදායම වැඩි කිරීමටත් රජයේ වියදම් කළමනාකරණය මඟින් අයවැය හිඟය අඩු කිරීමටත් ශ්‍රී ලංකා රජය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත. මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුවට (MTFF) අනුකූලව 2025-2029 සඳහා රජයේ ප්‍රමුඛතා ලෙස;


1. 2025 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයට ආදායම් අනුපාතය සියයට 15ක ප්‍රතිශතයක් දක්වා වැඩි කිරීම සහ අවම වශයෙන් එම මට්ටම පවත්වා ගැනීම හෝ ඊට ඉහළ අගයක් පවත්වා ගැනීම
2. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20ක ප්‍රතිශතයක් තුළ වියදම කළමනාකරණය කිරීම
3. 2026 වසර වන විට සහ ඉන් ඔබ්බට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක ප්‍රතිශතයකට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යාම
4. 2025 වසර වන විට සහ ඉන් ඔබ්බට අවම වශයෙන් සියයට 2.3ක ප්‍රතිශතයක ප්‍රාථමික අතිරික්තයක් ලඟා කර ගැනීම
5. දළ දේශීය නිෂ්පාදිතයට අනුව රජයේ ණය අනුපාතය, දළ මූල්‍ය අවශ්‍යතා සහ විදේශ ණය සේවාකරණය අඩු කිරීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ මූල්‍ය පහසුකම් වැඩසටහනට අනුකූලව තිරසාර මට්ටමක පවත්වාගෙන යාම දැක්විය හැක.


ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ මූල්‍ය පහසුකම් වැඩසටහනේ ඉලක්ක මත රජයේ ප්‍රාථමික අතිරික්තය 2025 වසර වන විට හා ඊට පසු වසරවලදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක ප්‍රතිශතයක් ලෙස පවත්වාගෙන යාමත් පාර්ලිමේන්තුවේ අනුමත වාර්ෂික අයවැය, ප්‍රාථමික ශේෂය, ආදායම්, සහ පොළී හැර අනෙකුත් වියදම් ඇතුළු වැඩසටහනේ පරාමිතීන්ට අනුකූල බව සහතික කිරීමත් යන කරුණු මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සකස් කිරීමේදී සැළකිල්ලට ගෙන ඇත.

7. වර්තමානයේ පවතින ණය කළඹ විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකා රජයේ ණය 2021 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 100 ක ප්‍රතිශතයකට ලඟා වූ අතර ගත් අතර එය 2022 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 114 ක ප්‍රතිශතයක් දක්වා වැඩි විය. 2023 වර්ෂය වන විට මෙම අහිතකර ප්‍රවණතාව ප්‍රතිගමනය වී දළ දේශීය නිෂ්පාදිතයට රජයේ ණය අනුපාතය සියයට 104 ක් දක්වා අඩු වී ඇත. 2024 වසරේදී දළ දේශීය නිෂ්පාදිතයට රජයේ ණය අනුපාතය සියයට 98 කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ මූල්‍ය පහසුකම් වැඩසටහනේ සාර්ව මූල්‍ය ප්‍රතිසංස්කරණ වලට අනුකූලවීමේ ප්‍රතිඵලයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ අපේක්ෂිත වර්ධනය තුළින් පසුගිය වර්ෂවලට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණය ප්‍රමාණය අඩු වී ඇත.

රූප සටහන 1: රජයේ ණය තොගය සහ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය






මූලාශ්‍රය: වාර්ෂික ආර්ථික විවරණය 2023, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

7.1 ණය උපකරණ අනුව හිඟ ණය

2024 වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුළු ණය කළඹ ඇ.ඩො. මිලියන 100,294 ක් ලෙස වාර්තා වී ඇති අතර ඉන් සියයට 63 ක ප්‍රතිශතයක් දේශීය ණය මූලාශ්‍ර වලින් ද, සියයට 37 ක ප්‍රතිශතයක් විදේශීය මූලාශ්‍රයන්ගෙන් ද සමන්විත වේ. මුළු ණය කළඹෙන් විශාලම කොටස භාණ්ඩාගාර බැඳුම්කර අත්කරගෙන ඇති අතර, එය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 48 ක ප්‍රතිශතයකි. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව(ISBs) විදේශීය ණය කළඹෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අත් කරගෙන ඇත. ශ්‍රී ලංකා රජයේ ණය කළඹෙන් සියයට 97 ක ප්‍රතිශතයක් ස්ථාවර පොලී අනුපාත මත ගිවිසුම්ගත ණය වලින් සමන්විත වේ.

රූප සටහන 2: ණය උපකරණ අනුව හිඟ ණය



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමණාකරන කාර්යාලය, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

7.2 වත්මන් ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම

වගුව 1 : පවතින ණය කළඹෙහි අන්තර්ගත පිරිවැය සහ අවදානම

අවදානම් දර්ශක		විදේශ ණය	දේශීය ණය	සමස්ථ ණය ප්‍රමාණය
ණය ප්‍රමාණය (රුපියල් බිලියන වලින්)		10,752..41	18,633.84	29,386.25
ණය ප්‍රමාණය (ඇමරිකානු ඩොලර් මිලියන වලින්)		36,697.6	63,596.7	100,294.4
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නාමික ණය ප්‍රමාණය		36.0	62.3	98.3
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වර්තමාන වටිනාකම[1]		31.7	62.3	94.1
ණය පිරිවැය[2]	දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම[3]	1.2	6.2	7.4
	බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය (ප්‍රතිශතය)	3.4	9.9	7.5
ප්‍රතිමූල්‍යාකරණ අවදානම[2]	කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර)	9.8	5.0	6.7
	වර්ෂයක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	4.8	26.8	19.1
	වර්ෂයක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)	1.5	16.0	17.6
පොලී අනුපාත අවදානම[2]	ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATR) (වසර)	9.3	5.0	6.5
	වර්ෂයක් තුළ දී ප්‍රතිස්ථාවර වන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	11.2	26.8	21.4
	භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව ස්ථාවර පොලී අනුපාත සහිත ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	92.3	100.0	97.3
	භාණ්ඩාගාර බිල්පත් (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	0.0	21.4	13.9
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය ණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)			37.5
	කෙටි කාලීන විදේශ විනිමය ණය (සංචිත වල ප්‍රතිශතයක් ලෙස)			29.2

[1] දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වර්තමාන වටිනාකම් ගණනය කිරීමේදී පුරෝකථනය කර ලද ණය සේවාකරන ගෙවීම් පදනම් කර ගෙන ඇති අතර සහනදායී හෝ අර්ධ සහනදායී කොන්දේසි මත එම ණය මෙවලම් සඳහා 5% ක වට්ටම් අනුපාතයක් යොදා ගන්නා ලදී.
[2] බර තබන ලද සාමාන්‍ය පොලී අනුපාතය, ප්‍රතිමූල්‍යාකරණ සහ පොලී අනුපාත අවදානම් වැනි, පුරෝකතනය කරන ලද මුදල් ප්‍රවාහ භාවිතා කරනු ලබන පිරිවැය-අවදානම් දර්ශක සඳහා, පුරෝකතනය කරන ලද විනිමය අනුපාත උපකල්පන භාවිත කර ඇත.
[3] හිඟ ණය සඳහා වූ පොලිය දළ දේශීය නිෂ්පාදිතයෙන් බෙදීමෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම ගණනය කර ඇත.

ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සකසන ලද මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ග විශ්ලේෂණ මෙවලමට (MTDS AT) අනුව, දළ දේශීය නිෂ්පාදිතයට අනුව නාමික ණය, ණය පිරිවැය, ප්‍රතිමූල්‍යකරණ අවදානම, පොලී අනුපාත අවදානම සහ විනිමය අනුපාත අවදානම වැනි ප්‍රධාන අවදානම් සහ පිරිවැය පරාමිතීන් භාවිතා කරමින් ණය කළඹේ පිරිවැය සහ අවදානම විශ්ලේෂණය කරන ලදී.

7.2.1 ණය පිරිවැය

අංක 1 වගුවෙහි සඳහන් පරිදි රජය ණය සඳහා පොලිය ගෙවීම පිණිස පමණක් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.4 ප්‍රතිශතයක් වැය කරනු ලබයි. මේ සඳහා විශේෂයෙන්ම, රටේ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙලීම නිසා රජය මුහුණ දුන් ප්‍රාග්ධන වෙළඳපොළට අනුගත වීමට ඇති සීමාවනුත්, අර්බුදකාරී තත්වයෙන් පසු රජය දේශීය වෙළඳපොළෙන් ඉහළ පොලී අනුපාතයක් යටතේ ණය ලබා ගැනීමෙන් ඇතිවූ ප්‍රවණතාවය ත් හේතු විය.

7.2.2 ප්‍රතිමූල්‍යකරණ අවදානම

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසු ද්විපාර්ශ්වික ණය, ජාත්‍යන්තර බැඳුම්කර, හා භාණ්ඩාගාර බැඳුම්කරවල කල්පිරීමේ කාලය දීර්ඝ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, වත්මන් ණය කළඹෙහි කල්පිරීමේ සාමාන්‍ය කාලය (ATM) අවුරුදු 6.7 ක් වී ඇත. 2025 වසරේ දී කල්පිරීමට නියමිත මුළු ණය ප්‍රමාණය ඇ. ඩො. බිලියන 18 ක් වන අතර, එයට ඇ. ඩො. බිලියන 13 ක භාණ්ඩාගාර බිල්පත් සහ ඇ. ඩො. බිලියන 3 ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ. ඒ අනුව, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 19.1 ප්‍රතිශතයක් ඉදිරි වසර තුළ කල්පිරීමට නියමිත (ආපසු ගෙවීමට නියමිත) ය. මුළු ණය ප්‍රමාණයෙන් කෙටි කාලීනව කල් පිරෙන මෙවැනි ණය ප්‍රතිශතයක් සැලකිය යුතු කරුණක් වන අතර එමගින් යම් ප්‍රමාණයක කෙටි කාලීන ප්‍රතිමූල්‍යකරණ අවදානමක් පෙන්නුම් කරයි. ණය කළඹෙන් වැඩි ප්‍රමාණයක් කෙටි කාලීනව කල්පිරීම සිදු වුවහොත්, රජයට මෙම ණය ප්‍රතිමූල්‍යකරණය කිරීමට හෝ ගෙවීමට සිදුවනු ඇති අතර අනපේක්ෂිත ද්‍රවශීලතා ගැටළු හෝ අහිතකර වෙළඳපල තත්ත්වයන් ඇතිවීම හේතුවෙන් එය අභියෝගාත්මක ද විය හැකිය. විශේෂයෙන් මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ පුරෝකථනය කර ඇති ආර්ථික දැක්ම සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වුවහොත්, ප්‍රතිමූල්‍යකරණ අවදානම තවදුරටත් වැඩි වනු ඇත.

7.2.3 පොලී අනුපාත අවදානම

ණය ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATR), වසර වලින් මනිනු ලබන අතර, ණය නැවත සකස් වීමට පෙර සාමාන්‍යයෙන් කොපමණ කාලයක් එහි වත්මන් පොලී අනුපාතයේ පවතිනු ඇත්දැයි දක්වයි. ණය කළඹෙන් ඉහළ ප්‍රතිශතයක් (සියයට 97.3) ස්ථාවර පොලී අනුපාත සහිත ණය උපකරණ වලින් සමන්විත නිසා එමඟින් ස්ථාවරත්වයක් ඇතිකරමින් පොලී අනුපාත වෙනස් වීමේ අවදානම අඩු කරයි. කෙසේ වෙතත්, ණය කළඹෙන් සියයට 21.4 ක ප්‍රතිශතයක් වසරක් ඇතුළත වෙනස් වන අතර, එනම් කෙටිකාලීනව පොලී අනුපාත වෙනස්කම් වලට යම් නිරාවරණයක් ඇති වේ. මෙය සැලකිය යුතු කරුණක් වන අතර පොලී අනුපාත වල වැඩි වීමක් වුවහොත් එය ණය කළඹට අහිතකර ලෙස බලපානු ඇත. භාණ්ඩාගාර බිල්පත් සියයට 13.9 ප්‍රතිශතයකින් සමන්විත අතර එමගින්

මුළු ණය කළඹෙන් යම් කොටසක් කෙටිකාලීන රජයේ සුරැකුම්පත්වල ඇති බව පෙන්නුම් කරයි, එය අඩු අවදානම් සහිත නමුත් අනාගත පොලී අනුපාත විචලනයන් අනුව ඉහළ ප්‍රතිමූල්‍යකරණ අනුපාතවලට යටත් විය හැකි වේ. සමස්තයක් ලෙස, වසරක කාලයක් තුළ සැලකිය යුතු ණය ප්‍රමාණයක් ප්‍රතිස්ථාවර වීමට නියමිත බැවින් කෙටි කාලීන පොලී අනුපාත වෙනස්කම් වලට මධ්‍යස්ථ නිරාවරණයක් සහිතව රජයේ ණය ව්‍යුහයට ස්ථාවර පොලී අනුපාත සහිත ණයවල ශක්තිමත් පදනමක් පවතින බව පෙනීයයි.


7.2.4 විනිමය අනුපාත අවදානම

මුළු ණය කළඹෙන් සියයට 37.5 ප්‍රතිශතයක් ලෙස විදේශ මුදල් වලින් (එනම්, විදේශ විනිමය ණය) ලබාගෙන ඇති අතර, විදේශ විනිමය විචලනයන්ට ඉහළ නිරාවරණයක් ඇති බව පෙන්නුම් කරයි, එනම් විනිමය අනුපාතවල වෙනස්වීම්, ණයෙහි වටිනාකමට හෝ එහි ආපසු ගෙවීමේ පිරිවැයට බලපෑම් ඇති කරනු ඇත. 2024 වසරේ දෙසැම්බර් මාසයේ වාර්තා වූ විදේශ සංචිතවල ප්‍රතිශතයක් ලෙස, කෙටිකාලීන විදේශ විනිමය ණය සියයට 29.2 ප්‍රතිශතයක් වන අතර එය විදේශ සංචිතයට සාපේක්ෂව ගත් විට කෙටිකාලීන විදේශ විනිමය ණය බැඳීම් සැලකිය යුතු ප්‍රමාණයක් වේ. මෙම බැඳීම් ආවරණය කිරීම සඳහා සංචිත ප්‍රමාණවත් විය යුතු බැවින්, එමගින් යම් මට්ටමක අවදානමක් පෙන්නුම් කරයි. විශේෂයෙන් විදේශ විනිමය වටිනාකම ඉහළ යෑමක් හෝ විනිමය අනුපාතවල හදිසි වෙනස්වීමක් සිදුවුවහොත්, විදේශ සංචිත ප්‍රමාණවත් නොවෙන විට දී, ද්‍රවශීලතා පීඩනයක් ඇති විය හැකිය.

7.3 ණය පියවීමේ පැතිකඩ

රූප සටහන 3: ණය පියවීමේ පැතිකඩ

ශ්‍රී ලංකාව: ණය පියවීමේ පැතිකඩ, 2024 වසර අවසන් වනවිට (රුපියල් මිලියන වලින්)



රුපියල් රුපියල් බිලියන 3,827 ක් වන භාණ්ඩාගාර බිල්පත් 2025වසර තුළදී කල් පිරීමට නියමිතය. ඇ.ඩො. 268,685,000ක් වන ඉතිරි වී ඇති අන්තර්ජාතික ස්වෛරීය බැඳුමකර (ISB) (අධිකරණයේ නඩුවක් පවතින, Hamilton Reserve Bank ට අදාල බැඳුමකරයද ඇතුළුව) 2025 වසරේ දී ප්‍රතිමූල්‍යකරණය වේ යැයි උපකල්පනය කර ඇත.

2025 වසරේ දී කල්පිරීමට නියමිත රුපියල් බිලියන 3,827.16 ක් වන භාණ්ඩාගාර බිල්පත් නිසා, එම වසර සඳහා පුරෝකථනය කරන ලද ණය සේවාකරණය සැලකිය යුතු ලෙස වැඩි වනු ඇත. ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් ආපසු ගෙවීමට හෝ ප්‍රතිමූල්‍යකරණය කිරීමට සිදුවනු ඇති බැවින්, 2025 වසරේ දී රජයට කෙටිකාලීන ද්‍රවශීලතා පීඩනයක් ඇති වන බැවින් එය කළමනාකරණය කිරීම සඳහා වලක්වාලීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු, රජය 2028 වසරේ සිට ප්‍රතිව්‍යුහගත ණය සේවාකරණය (ද්විපාර්ශ්වික ණය, ජාත්‍යන්තර ස්ථෛරී බැඳුම්කර ආකාරයෙන් ලබාගත් වාණිජ ණය සහ අපනයන ණය ඇතුළුව) ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. මෙම ණය ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් රජයට මධ්‍ය කාලීනව මුදල් ප්‍රවාහ කළමනාකරණයේදී සැලකිය යුතු සහනයක් ලැබී තිබේ. මෙමගින් ඇතිවන දිගුකාලීන ධනාත්මක වර්ධනයක් නම්, පවතින භාණ්ඩාගාර බැඳුම්කරවලින් සියයට 98 ක ප්‍රතිශතයක් 2038 වසර වන විට කල්පිරෙන අතර එමඟින් දේශීය ණය බර රුපියල් බිලියන 13,884.64 කින් අඩු වීමයි.

ජාත්‍යන්තර ස්ථෛරී බැඳුම්කර කල්පිරීමට නියමිත 2038 වසර වන තෙක් රජය විදේශ ණය සමානව ගෙවීම දිගටම කරගෙන යනු ඇත. 2028 වසරේ සිට විදේශ ණය සේවාකරණය සැලකිය යුතු ලෙස වැඩි වන අතර, මෙම සේවාකරණයේ පිරිවැය මධ්‍ය කාලීනව ස්ථාවර වෙමින් 2028 වසර සහ 2038 වසර අතර කාලය තුළ ඉහළම පීඩනයක් ඇතිකරනු ඇත.

8. ප්‍රධාන පිරිවැය සහ අවදානම් ඉලක්ක

2025-2029 උපාය මාර්ග කාලපරිච්ඡේදය අවසාන වන විට මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සඳහා පිරිවැය සහ අවදානම් දර්ශක වල ඉලක්කගත අගයන් පිළිබඳ තොරතුරු 2 වන වගුවෙහි දැක්වේ.

වගුව 2: ප්‍රධාන පිරිවැය සහ අවදානම් ඉලක්ක

ප්‍රධාන පිරිවැය සහ අවදානම් දර්ශක	වත්මන් තත්ත්වය (2024 අවසන් වන විට)	2029 සඳහා ඉලක්කය	විචලනය
ණය පිරිවැය			
දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රජයේ නාමික ණය	98.3%	85%	+/-10
මුළු ණයෙහි ප්‍රතිශතයක් ලෙස විදේශ ණය ප්‍රමාණය	37.5%	35%	+/-5
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම	7.4%	5%	+/-1
ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම	44.72%	40%	+/-2
ප්‍රතිමූල්‍යකරණ අවදානම			
මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස වසර 1 කින් කල් පිරෙන ණය ප්‍රමාණය	19.1%	10%	+/-3
මුළු ණය කළඹේ කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර)	6.7	7.5	+/-1
පොලී අනුපාත අවදානම			
භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව ස්ථාවර පොලී අනුපාත සහිත ණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	97.3%	95%	+/-2
ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATR) (වසර)	6.5	7	+/-1
විදේශ විනිමය අවදානම			
කෙටි කාලීන විදේශ විනිමය ණය (සංචිත වල ප්‍රතිශතයක් ලෙස)	29.2%	25%	+/-2

9. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගය 2025-2029

මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ දක්වා ඇති පරිදි රජයේ මධ්‍ය කාලීන සාර්ව ආර්ථික පුරෝකථනයන් මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයන්හි අන්තර්ගත කර ඇත. අයවැය නොවන වියදම් හේතුවෙන් ඇතිවන අවිනිශ්චිත වගකීම් විශ්ලේෂණය සඳහා ඇතුලත් කර නොමැත.

විශ්ලේෂණය සඳහා පාදක මුදල ලෙස එක්සත් ජනපද ඩොලරය (USD) සලකන ලදි. 2024 වසරේ දෙසැම්බර් මස 31 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතය USD1=LKR 293 අනුව, දර්ශක අනුපාත භාවිතා කරමින් විවිධ මුදල් ඒකකවල ණය, දේශීය මුදල් බවට පරිවර්තනය කරන ලදි.

9.1 උපකල්පන

2022 වසරේ අප්‍රේල් මස 12 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද සාමාන්‍ය ණය සේවා අත්හිටුවීමේ අන්තර්කාලීන ප්‍රතිපත්තියේ පරිමිතිය තුළ ගෙවන ලද හිඟ ණය (DOD), මූලික පුරෝකථනය සහ විදේශ ණය පිළිබඳ පොලී පුරෝකථනය පහත උපකල්පන මත පදනම්ව ගණනය කර ඇත.

- ජපානය, ඉන්දියාව EXIM, හංගේරියාව, ඇමරිකා එක්සත් ජනපදය - අවසන් කරන ලද සංශෝධිත ගිවිසුම් අනුව
- කුවේට් - ණයහිමියා සහ ශ්‍රී ලංකා රජය අතර එකඟ වූ නියමයන් සහ කොන්දේසි අනුව
- පකිස්ථානය, ජර්මනිය, ප්‍රංශය, එක්සත් රාජධානිය - OCC ගිවිසුමට අනුව (ගිවිසුම් සඳහා සංශෝධනයන් අවසන් වී නොමැත.)
- අනෙකුත් සියලුම ණයහිමියන් - පෙරනිමි පොලී සැලකිල්ලට නොගෙන OCC ගිවිසුම මත පදනම්ව.
- ඇ.ඩො. 268,685,000ක් වන ඉතිරි වී ඇති අන්තර්ජාතික ස්වෛරීය බැඳුම්කර (ISB) (අධිකරණයේ නඩුවක් පවතින, Hamilton Reserve Bank ට අදාල බැඳුම්කරයද ඇතුළුව) 2025 වසරේ දී ප්‍රතිමූල්‍යකරණය කිරීම.

9.2 උපාය මාර්ග

ණය කළමනාකරණ උපාය මාර්ග හතරක් යටතේ මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගික විශ්ලේෂණ යෙදවුම පරීක්ෂා කරන ලදි.

1) උපාය මාර්ග **1 (S1): පවතින තත්ත්වය අඛණ්ඩව පවත්වා ගැනීම**
   - විදේශීය ණය සියයට 40 සහ දේශීය ණය සියයට 60 වන වර්තමාන සංයුතිය අඛණ්ඩව පවත්වා ගැනීම

2) උපාය මාර්ග **2 (S2): දේශීය ණය ඉලක්ක කරගත් මූල්‍යයනය කිරීමේ උපාය මාර්ගය**
   - විදේශීය ණය සියයට 20 සහ දේශීය ණය සියයට 80%
   - ප්‍රතිමූල්‍යකරණය සහ ණය ගැනීමේ පිරිවැය පියවා ගැනීම සඳහා මධ්‍ය කාලීන සිට දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වැඩි කිරීම සහ භාණ්ඩාගාර බිල්පත් මත යැපීම ක්‍රමයෙන් අඩු කිරීම
   - විදේශීය වාණිජ ණය ගැනීම් මත යැපීම අඩු කිරීම සහ විදේශ ණය ගැනීම් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහනදායී ණය සඳහා සීමා කිරීම
   - විචල්‍ය පොලී අනුපාත යටතේ ණය ගැනීම් අඩු කිරීම


3) උපාය මාර්ග **3 (S3): සම මූල්‍ය උපාය මාර්ගය**
   - විදේශීය ණය 50% සහ දේශීය ණය 50%
   - වඩාත් හිතකර කොන්දේසි ඇතුළත් කරමින් විශේෂයෙන් ස්ථාවර අනුපාත යටතේ විදේශ මූල්‍යකරණය ඉහළ නැංවීම
   - භාණ්ඩාගාර බිල්පත් මත යැපීම අඩු කිරීම සහ භාණ්ඩාගාර බැඳුම්කර සංයුතිය වැඩි කිරීම

4) උපාය මාර්ග **4 (S4): විදේශීය මූල්‍ය ඉලක්ක කරගත් මූල්‍ය උපාය මාර්ගය**
   - විදේශ ණය 80% සහ දේශීය ණය 20%
   - විදේශීය සහනදායී ණය මත වැඩි නැඹුරුවක් දක්වමින් විදේශ මූලාශ්‍රවලින් අමතර අරමුදල් රැස් කිරීම සඳහා සමස්ත විදේශ ණය ගැනීම් වැඩි කිරීම
   - භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම අඩු කිරීම

9.3 දළ ණය ගැනීමේ ප්‍රතිශතයේ ව්‍යාප්තිය

රූප සටහන 4 මගින්, පරීක්ෂණ කාල සීමාව තුළ විවිධ වූ උපාය මාර්ගයන් හතරක් (04) යටතේ, දළ ණය ගැනීමේ ප්‍රතිශතයන්හි ව්‍යාප්තිය, මූල්‍යකරණ ණය උපකරණයන් සහ එම මූල්‍යකරණ ණය උපකරණයන්හි ප්‍රතිශතයන් පෙන්නුම් කරනු ලබයි.

රූප සටහන 4: දළ ණය ගැනීමේ ප්‍රතිශතයේ ව්‍යාප්තිය



9.4 එක් එක් උපාය මාර්ගයන්හි පිරිවැය සහ අවදානම් විශ්ලේෂණය

වගුව 4න්, විවිධ ණය කළමනාකරණ උපාය මාර්ග හතරට අනුරූපී පිරිවැය අවදානම් දර්ශක දැක්වේ. මෙම දර්ශක මගින් නාමික ණය, වර්තමාන වටිනාකම් ණය, පොලී ගෙවීම්, ප්‍රතිමූල්‍යකරණ අවදානම, පොලී අනුපාත අවදානම සහ විදේශ විනිමය (FX) අවදානම ඇතුළුව ණය තිරසාරභාවයේ විවිධ අංශ තක්සේරු කර ඇත.

වගුව 3: එක් එක් උපාය මාර්ගයන්හි පිරිවැය සහ අවදානම් දර්ශක

අවදානම් දර්ශක		2024	2029 අවසානය වන විට			
		පවතින	S1	S2	S3	S4
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස නාමික ණය		98.3	77.3	71.2	80.4	89.5
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණයෙහි වර්තමාන වටිනාකම		94.1	69.5	66.4	71.0	75.5
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම		7.4	4.6	4.9	4.4	3.8
ප්‍රතීයමාන පොලී අනුපාතය (ප්‍රතිශතය)		7.5	5.8	6.9	5.4	4.1
ප්‍රතිමූල්‍යකරණ අවදානම	වර්ෂයක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	19.1	9.4	11.3	8.5	6.4
	වර්ෂයක් තුළ දී කල් පිරෙන ණය ප්‍රමාණය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස)	17.6	7.3	8.0	6.9	5.7
	විදේශීය ණය කළඹේ කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර)	9.8	9.8	8.9	10.0	10.5
	දේශීය ණය කළඹේ කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර)	5.0	3.8	3.6	3.9	4.3
	සමස්ත ණය කළඹේ කල්පිරීමේ සාමාන්‍ය කාලය (වසර)	6.7	7.8	6.7	8.2	9.2
පොලී අනුපාත අවදානම	ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලය (ATR) (වසර)	6.5	7.2	6.3	7.6	8.4
	වර්ෂයක් තුළ දී ප්‍රතිස්ථාවර වන ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	21.4	17.7	17.4	17.8	18.2
	භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව ස්ථාවර පොලී අනුපාත සහිත ණය ප්‍රමාණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	97.3	91.1	93.5	90.1	87.4
	භාණ්ඩාගාර බිල්පත් (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	13.9	4.6	6.7	3.7	1.3
විදේශ විනිමය අවදානම	විදේශ විනිමය ණය (මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස)	37.5	53.3	40.7	58.8	73.2
	කෙටි කාලීන විදේශ විනිමය ණය (සංචිත වල ප්‍රතිශතයක් ලෙස)	29.2	24.3	19.5	26.7	33.9

ණය අඩු කිරීම (ණයෙහි නාමික සහ වර්තමාන වටිනාකම)

රාජ්‍ය මූල්‍ය කෙරෙහි ඇතිවන බලපෑම අවම කරමින් ආර්ථික නිමැවුමට සාපේක්ෂව සමස්ත ණය ප්‍රමාණය අවම අගයක් ගන්නා බැවින් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව නාමික ණය පහළ අගයක පැවතීම සාමාන්‍යයෙන් හිතකර වේ. අනෙක් උපාය මාර්ගයන් හා සැසඳීමේ දී, S2 (සියයට 71.2) උපාය මාර්ගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණය සඳහා වූ වඩාත්ම හිතකර අනුපාතය ලබා දේ.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ණයෙහි වර්තමාන වටිනාකම අවම අගයක් ගැනීම තුළින් රජයේ ණය තිරසාර බවත් , සැබෑ ණය ප්‍රමාණය කාලයත් සමඟ අඩු වන බවත් පෙන්නුම් කෙරේ. ඒ අනුව, S2 (සියයට 66.4) උපාය මාර්ගය යනු මනාව කළමනාකරණය කළ හැකි ණය ප්‍රමාණය පෙන්නුම් කරන වඩාත් ප්‍රශස්ත උපාය මාර්ගය වේ.

පොලී ගෙවීම්

දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ගෙවිය යුතු පොලිය, සලකන ලද සියලු උපායමාර්ගයන් සඳහා ඉලක්ක කළ අගයට වඩා අඩු අගයන් දැනට පවතින තත්වය අනුව පෙන්නුම් කරන අතර S4 උපාය මාර්ගයෙහි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගෙවිය යුතු පොලී ප්‍රමාණය අවම අගය වන බැවින්, S4 උපාය මාර්ගය වඩාත් හිතකර උපාය මාර්ගය වේ

ප්‍රතීයමාන පොලී අනුපාතය

ප්‍රතීයමාන පොලී අනුපාතය සඳහා අවම අගය S4 (සියයට 4.1) උපාය මාර්ගය සඳහා ද, ඉන්පසුව පිළිවෙළින්, S3 (සියයට 5.4) උපාය මාර්ගය ද, S1 (සියයට 5.8) උපාය මාර්ගය සහ S2 (සියයට 6.9) උපාය මාර්ගය ලබා දී ඇත. අවම ප්‍රතීයමාන පොලී අනුපාතයක් ඇති විට රජයට වඩාත් හිතකර කොන්දේසි යටතේ ණය ගැනීමට හැකි වන අතර එමඟින් ණය සේවා කිරීමේ පිරිවැය අඩු වේ.

ප්‍රතිමූල්‍යකරණ අවදානම

2025 වසරේ දී කල්පිරෙන ණය අවම ප්‍රමාණයකින් (සියයට 6.4) සමන්විත S4 උපාය මාර්ගය සතුව අඩුම ප්‍රතිමූල්‍යකරණ අවදානමක් ඇත. මෙමඟින්, රජයට මනාව කළමනාකරණය කළ හැකි ණය කල්පිරීමේ කාල සටහනක් ඇති බවත් ප්‍රතිමූල්‍යකරණ පීඩනයන්ට අඩු අවදානමක් ඇති බවත් අදහස් වේ. කෙසේ වෙතත්, සලකන ලද උපාය මාර්ග හතරම ඉලක්ක කළ අගයට වඩා අඩු ප්‍රතිමූල්‍යකරණ අවදානම් අගයන් ගනී.

පොලී අනුපාත අවදානම

S4 උපාය මාර්ගය සහ S3 උපාය මාර්ගය සඳහා වසර 8.4ක සහ වසර 7.6ක, ප්‍රතිස්ථාවර වීම සඳහා ගතවන සාමාන්‍ය කාලයන් (ATR) ඇති අතර, එම අගයන් සාපේක්ෂව ඉහළ අගයන් වේ. එමඟින්, පොලී අනුපාත අස්ථාවරත්වයට එරෙහිව ඉහළ ආරක්ෂාවක් සැපයේ.

S2 සඳහා වසර 6.3ක පහළ ATR අගයක් ඇති අතර, එබැවින්, S2හි ණය වඩා ඉක්මනින් පොලී අනුපාත වෙනස්වීම් වලට යටත් විය හැක.

විදේශ විනිමය අවදානම

S3 උපාය මාර්ගය (සියයට 58.8) සහ S4 උපාය මාර්ගය (සියයට 73.2) හා සැසඳීමේ දී S2 උපාය මාර්ගය විදේශ විනිමය ණය අගය (ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස) අවම (සියයට 40.7) වන අතර, එමඟින්, මුදල් උච්චාවචනයන්ට ගොදුරු වීමේ අවදානම අඩු කෙරේ. දේශීය මුදල් අවප්‍රමාණය වීමක දී, විදේශ මුදල් පාදක කොටගත් ඉහළ විදේශ ණය මට්ටම් සහිත S3 සහ S4 වැනි උපාය මාර්ගයන්හි විනිමය අනුපාත අවදානම වැඩි වේ. S2හි කෙටි කාලීන විදේශ විනිමය ණය (සංචිත වල ප්‍රතිශතයක් ලෙස) අවම අගයක් (සියයට 19.5) ගන්නා අතර, S3 සහ S4 ට සාපේක්ෂව කෙටි කාලීන විදේශ මුදල් වගකීම් හැසිරවීමට ඉවහල් වන වැඩි සංචිත ධාරිතාවක් ඇති බව පෙන්නුම් කෙරේ.

10. 2025-2029 සඳහා අභිමත උපායමාර්ගය සහ එහි බලපෑම

යෝජිත උපායමාර්ගයන් හතරෙහි පිරිවැය සහ අවදානම් විශ්ලේෂණය මත පදනම්ව, 2025-2029 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවට ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් සහ සිදුකෙරෙමින් පවතින සාර්ව මූල්‍ය ප්‍රතිසංස්කරණවලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීම සඳහා වඩාත්ම ප්‍රශස්ත උපාය මාර්ගය ලෙස දෙවන උපායමාර්ගය (S2) හැඳින්විය හැක.

1) **දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය පහළ අගයක් ගැනීම**
S2 උපාය මාර්ගය මගින් ණය තොගයෙහි නාමික මෙන්ම වර්තමාන අගයට ගළපන ලද වටිනාකම යන දෙකම සැලකිය යුතු ලෙස අඩු කරන අතර, මධ්‍ය කාලීනව ණය බර කළමනාකරණය කිරීමේ හැකියාව ඉහළ නංවයි. මෙයින් ගම්‍ය වන්නේ S2 උපායමාර්ගය අනුව, අඩු ණය සේවාකරණයත්, රාජ්‍ය මූල්‍ය මත පීඩනය අඩු කිරීම අතර සංවර්ධනය ඉලක්ක කරගත් වියදම් සඳහා වැඩි ඉඩක් ලබා ගත හැකි බවයි. රටෙහි සන්දර්භය සැලකිල්ලට ගත් විට, අඩු ණය-දළ දේශීය නිෂ්පාදිත අනුපාත මූල්‍ය තිරසාරභාවය සහතික කරන අතර, එමඟින් අනාගතයේදී වඩා හොඳ ණය ශ්‍රේණිගත කිරීමක් සඳහා මග පාදන අතර, ණය ගැනීමේ පිරිවැයක් අඩු කර ගැනීමට අවස්ථාව සලසයි.

2) **පොලී ගෙවීම් පාලනය**
S1 උපායමාර්ගය හා සසඳන විට S2 උපායමාර්ගයෙහි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස තරමක් ඉහළ පොලී ගෙවීමක් තිබුණද, එය තවමත් වත්මන් මට්ටමට වඩා සැලකිය යුතු ලෙස අඩු වන අතර, ඉලක්කය තුළ පවතී. මෙයින් ගම්‍ය වන්නේ, කාලයත් සමඟ, S2 උපායමාර්ගය තවමත් ණය සේවා කිරීමේ මූල්‍ය බර අඩු කරන බවත්, අනෙකුත් ආර්ථික අවශ්‍යතා සඳහා සම්පත් නිදහස් කර ගැනීමට අවස්ථාව ඇති කර ගත හැකි බවත්ය. අඩු පොලී ගෙවීම් මඟින් අයවැය වෙන්කිරීමේදී වඩාත් නම්‍යශීලීභාවයක් ලබා දෙන අතර, මූල්‍ය තත්වය යහපත්ව පවත්වා ගැනීමට හානියක් නොවන පරිදි ප්‍රධාන ආයෝජනවලට ප්‍රමුඛත්වය දීමට උපකාරී වේ.

3) **ප්‍රතිමූල්‍යයන අවදානම**

S2 ණය කල්පිරීම් කාලය වඩාත් ඒකාකාරව ව්‍යාප්ත කිරීම මගින් ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කරයි. සාර්ව ආර්ථික කම්පනයකදී ණය අර්බුදයක් ඇතිවීමේ හැකියාව වළක්වා ගැනීම සඳහා මෙය ඉතා වැදගත් වේ.

4) **විදේශ විනිමය අවදානම් කළමනාකරණය**

S1 උපායමාර්ගයේ විදේශ විනිමයෙන් ලබාගනුලබන ණය නිරාවරණය (සියයට 53.3) හා සසඳන විට S2 උපායමාර්ගයෙහි විදේශ විනිමයෙන් ලබාගනුලබන ණය නිරාවරණය (සියයට 40.7) අඩු අගයකි. විදේශ විනිමයෙන් ලබාගනු ලබන ණය ප්‍රමාණය අඩු වීම හේතුවෙන් රටෙහි විනිමය උච්චාවචනයන් හේතුවෙන් ණය සේවාකරණ පිරිවැය ඉහළ යාමේ අවදානම අවම වේ. අවිනිශ්චිත ගෝලීය වෙළෙඳපොළ තත්වයන් තුළ මුදලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් විදේශ ණය පිරිවැය ඉහළ යාම මෙහිදී විශේෂයෙන් වැදගත් වේ. S2 උපායමාර්ගයෙහි අඩු විදේශ විනිමයෙන් ආරෝපිත ණය නිරාවරණය රටේ මූල්‍ය ස්ථාවරත්වය වැඩි දියුණු කරන අතර, මුදලේ දුර්වලවීම සිදුවන කාලවලදී සංචිත ක්ෂය වීමේ අවදානම අවම කරයි.

S2 උපායමාර්ගයෙහි විදේශ සංචිතවලට සාපේක්ෂව කෙටි කාලීන විදේශ විනිමය ණය ප්‍රතිශතය අඩු අගයකි (සියයට 19.5කි). මෙයින් අදහස් කරනුයේ රට කෙටි කාලීන විදේශ ණය බැඳීම් සපුරාලීමට ශක්තිමත් ස්ථානයක සිටින බවත්, එමඟින් ද්‍රවශීලතා අර්බුදයක අවදානම අඩු කරන බවත්ය. සංචිතවලට සාපේක්ෂව කෙටිකාලීන විදේශ විනිමය ණය නිරාවරණය අඩු වීම යනු මුදල් හෝ මූල්‍ය කම්පනයකදී වැඩි සහනයක් ලබා දීම, වැඩි මූල්‍ය ස්ථාවරත්වයක් සහතික කිරීම සහ හදිසි අරමුදල් ගැටළු ඇතිවීමේ සම්භාවිතාව අඩු කිරීමයි.

ඉහත කරුණු අනුව, මධ්‍ය කාලීනව මූල්‍ය ස්ථාවරත්වය, ණය තිරසාරභාවය සහ අවදානම් අවම කිරීම අතර සමතුලිතතාවයක් ඇති කර ගැනීම සඳහා S2 උපායමාර්ගය ප්‍රශස්ත උපායමාර්ගය ලෙස සැලකිය හැකිය. සාරාංශයක් ලෙස, S2 උපායමාර්ගය අඩු ණය බර, අඩු අවදානම් නිරාවරණය සහ දිගු කාලීන මූල්‍ය තත්වය යහපත්ව පවත්වා ගැනීම සඳහා හොඳම සමතුලිතතාවයට සහාය දෙන අතර, එය 2025-2029 සඳහා රටට වඩාත්ම හිතකර උපායමාර්ගය බවට පත්වන අතර, එය මධ්‍ය කාලීනව ණය තිරසාරභාවය සහ මූල්‍ය තත්වය යහපත්ව පවත්වා ගැනීම සඳහා මඟ පාදයි. ඒ අනුව, ශ්‍රී ලංකාව යහපත් සාර්ව මූල්‍ය පරිසරයක් සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කරන වර්තමාන සන්දර්භය තුළ තිරසාර ණය කළමනාකරණය සහ මූල්‍ය ස්ථාවරත්වය සඳහා S2 උපායමාර්ගය ප්‍රශස්ත තේරීම වේ.

දිගුකාලීන, සහනදායී බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික විදේශ මූල්‍යකරණයන් සමඟ රජයේ මූල්‍ය අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට සහ පොදු යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙම උපායමාර්ගය මගපාදයි. එය දිගු කාලීනව දේශීය ණය වෙළඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා ද අවස්ථාවක් ලබා දේ.

11.අභිමත උපායමාර්ගය හා සම්බන්ධිත අවදානම හා අවදානම අවම කිරීමේ යාන්ත්‍රණය

ප්‍රධාන අවදානම් සාධක	දිගු කාලීනව අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණය
කෙටිකාලීනව ණය පරිණත වීම, ද්‍රවශීලතා පීඩනයන්ට හේතු විය හැක.	**ණය කල්පිරීමේ පැතිකඩ සුමට කර ගැනීම** ඉදිරි වසරවලදී දිගු කාලීන ණය නිකුත් කිරීම සහ අධික ලෙස කෙටි කාලීන ණය කල්පිරීම් අඩු කිරීම සඳහා ණය කල්පිරීම ප්‍රතිව්‍යුහගත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමෙන් **ණය නිකුත් කිරීමේ සැලැස්මක් ස්ථාපිත කිරීම:** රජය විසින් ණය වක්‍රීයව ක්‍රමයෙන් නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන බහු වාර්ෂීය ණය නිකුත් කිරීමේ උපාය මාර්ගයක් අනුගමනය කළ යුතු අතර, විශාල ප්‍රතිමූල්‍යකරණ උච්චාවචනයන් වළක්වා ගත යුතුය.
ප්‍රතීයමාන පොලී අනුපාත වැඩිවීම කාලානුරූපීව ණය සේවාකරණ පිරිවැය ඉහළ යාමට හේතු විය හැක.	**පොලී අනුපාත සඳහා අවදානම් ආවරණය:** විශේෂයෙන් අනාගතයේදී ණය ගැනීමේ අනුපාත සැලකිය යුතු ලෙස වැඩි වුවහොත් ඉහළ යන පොලී අනුපාතවලට එරෙහිව ආරක්ෂා වීමට ව්‍යුත්පන්නයන් (පොළී අනුපාත හුවමාරු හෝ ඉදිරි අනුපාත ගිවිසුම් වැනි) භාවිත කිරීම. **ස්ථාවර අනුපාත සහිත ණය නිකුත් කිරීම ඉහළ දැමීම:** S2 උපායමාර්ගය ස්ථාවර අනුපාත ණයවල ඉහළ ප්‍රතිශතයක් පවත්වා ගෙන යන අතර, මෙම අනුපාතය තවදුරටත් වැඩි කිරීම මගින් අඩු අනුපාතයන්ගෙන් ණය පවත්වාගෙන යාම සහ අනාගත අනුපාත ඉහළ යාමේ අවදානම අවම කිරීමට උපකාරී වේ. නව ණය උපකරණ සහ ක්‍රම ගවේෂණය කිරීමෙන් ණය උපකරණ විවිධාංගීකරණය කිරීම.
මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස විදේශ විනිමයෙන් ලබාගත් ණය, රට විනිමය අනුපාත උච්චාවචනයන්ට නිරාවරණය කරන අතර දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වුවහොත් ණය සේවාකරණ පිරිවැය ඉහළ යාමේ අවදානමක් ඇති කරයි.	**විදේශ විනිමයෙන් ලබාගනු ලබන ණය මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම:** විදේශ නාමික ණයවල මුදල් වර්ග විවිධාංගීකරණය කිරීම. **විදේශ විනිමය සංචිත කළමනාකරණය:** රටේ විදේශ ණය බැඳීම් සපුරාලීම සඳහා විදේශ විනිමය සංචිත ප්‍රමාණවත් බවත් උපායමාර්ගිකව කළමනාකරණය කරන බවත් සහතික කිරීම. **විදේශ විනිමය නිරාවරණය සඳහා වූ ආවරණය:** මූල්‍ය අවදානවලට එරෙහිව ආරක්ෂා වීමට විදේශ විනිමය ව්‍යුත්පන්නයන් (ඉදිරි ගිවිසුම් හෝ විදේශ විනිමය හුවමාරු වැනි) භාවිතා කිරීම.
ද්‍රවශීලතා අවදානම	**ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් ගොඩනඟීම:** විශේෂයෙන් අස්ථාවර තත්වයන් යටතේ, ණය ගෙවීම් නියමිත පරිදි සිදුකිරීමට ප්‍රමාණවත් මූල්‍යන සම්පත් ඇති බව සහතික කිරීම සඳහා ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් ස්ථාපිත කිරීම.

	මුදල් ප්‍රවාහ පුරෝකථනය: ඉදිරියේදී සිදුකරනු ලබන ණය ආපසු ගෙවීම් සිදුකිරීමට සහ අවාසිදායක කොන්දේසි යටතේ ප්‍රතිමූල්‍යකරණය කිරීමට අවශ්‍ය නොවී බැඳීම් සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට සවිස්තරාත්මක මුදල් ප්‍රවාහ පුරෝකථන ආකෘති භාවිත කිරීම.
ණය තොගයට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාත අඩු වුවද, ණය තිරසාරත්වය පවත්වාගැනීම සමස්ත මූල්‍ය තත්වය යහපත් තත්වයක පවත්වා ගැනීම සහ අනාගත අයවැය කළමනාකරණය මත රඳා පවතී.	**මූල්‍ය ඒකාබද්ධකරණය අනුගමනය කිරීම:** මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුවෙහි දක්වා ඇති පැහැදිලි ක්‍රියාමාර්ගයක් සමඟින්, කාලානුරූපීව අයවැය හිඟය අඩු වන බව සහතික කිරීම. **ආර්ථික වර්ධන පිළිබඳ අවධානය:** දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ඉහළ නංවන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහාය වීම. **ණය තිරසාරභාවය විශ්ලේෂණය:** ණය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතීද යන්න තක්සේරු කිරීම සඳහා කාලානුරූපීව ණය තිරසාරභාවය පිළිබඳ විශ්ලේෂණ සිදු කිරීම.
දේශපාලන අස්ථාවරත්වය, ප්‍රතිපත්තීන්ගේ වෙනස්වීම් හෝ දුර්වල ආයතනික රාමුව	**ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම:** ණය කළමනාකරණය, මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආයතනික රාමු වැඩිදියුණු කිරීම. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම උපායමාර්ගය ඵලදායීව සහ විනිවිදභාවයෙන් ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ. **ප්‍රතිපත්තිකෙරෙහි අනවරත කැපවීම සහ විනිවිදභාවය:** ණය උපායමාර්ගය පිළිබඳ පුළුල් දේශපාලන එකඟතාවයක් සහ මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා ශක්තිමත් කැපවීමක් ඇති බව සහතික කිරීම.

12.නිගමනය

ඉහළ අයවැය හිඟය සහ පහල ආදායම් තත්ත්වය ඇතුළු ශ්‍රී ලංකාවේ මූල්‍යමය අභියෝග හේතුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සහාය දක්වන ලද ආර්ථික ගැලපුම් වැඩසටහනකට අනුකූල වන පරිදි ණය ක්‍රමානුකූලව සහ එකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු වන තෙක්, සාමාන්‍ය ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමට සිදුකරණ ලදී. ඒ අනුව, රජය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කළ අතර, ඒ අනුව ලබාගත් ණය සහනය ඩොලර් බිලියන 17 ක් වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විසිතීරණ ණය පහසුකම් වැඩසටහනට සමගාමීව, 2032 වන විට දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය තොගය සියයට 95 දක්වා අඩු කිරීම සහ වාර්ෂික මූල්‍ය අවශ්‍යතා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13 ට වඩා අඩුවෙන් තබා ගැනීම වැනි ප්‍රධාන ණය තිරසාර ඉලක්ක සපුරා ගැනීම රජය අරමුණු කරයි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ අරමුණින්, රජය විසින් 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත රටේ තනි ණය කළමනාකරණ නීතියක් ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර, රාජ්‍ය ණය කළමනාකරණ මෙහෙයුම් මධ්‍යගත කිරීම සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත කරන ලදී. මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය සකස් කිරීම එම පනතෙන් ස්ථාපිත නීතිමය අවශ්‍යතාවයකි. දිගු කාලීනව ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක සාර්ථකව සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින්, ඉදිරි වසර පහ තුළ රජයේ ණය කළමනාකරණය කිරීම සඳහා මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025-2029 එළි දක්වා ඇත. ඒ අනුව, මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය 2025-2029 ණය කල්පිරීම දීර්ඝ කිරීම, ස්ථාවර අනුපාත ණය ගැනීම් ඉහළ නැංවීම සහ දේශීය ණය ගැනීම් වැඩි කිරීම අරමුණු කරයි.

2025-2029 කාලපරිච්ඡේදය සඳහා ණය කළමනාකරණ උපායමාර්ගය, දේශීය හා විදේශීය මූල්‍යකරණ සියයට 80 හා සියයට 20 අනුපාතයකින් පවත්වා ගනිමින් වඩාත් දේශීය වශයෙන් නැඹුරු වූ මූල්‍යකරණ උපායමාර්ගයක් කෙරෙහි අවධානය යොමු කරන අතර, ප්‍රතිමූල්‍යකරණය සහ ණය ගැනීමේ පිරිවැය පියවා ගැනීම සඳහා මධ්‍ය කාලීන සහ දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ඉහළ නංවන අතර භාණ්ඩාගාර බිල්පත් මත යැපීම ක්‍රමයෙන් අඩු කරයි. ස්ථාවර පොලී අනුපාත සහිත ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහනදායී ණය සඳහා විදේශ ණය ගැනීම කළමනාකරණය කිරීම කෙරෙහි ද එය අවධානය යොමු කරයි.

මෙම ණය කළමනාකරණ උපායමාර්ගය රටේ ණය බර ඵලදායී ලෙස අඩු කිරීම, මූල්‍ය පීඩනය ලිහිල් කිරීම සහ වර්ධනය ඉලක්ක කරගත් ආයෝජන සඳහා වැඩි ඉඩක් සපයයි. මෙම උපාය මාර්ගය පොලී ගෙවීම් සඳහා සමබර ප්‍රවේශයක්, ප්‍රතිමූල්‍යකරණ අවදානම අවම කිරීම සහ විදේශ විනිමය උච්චාවචනයන්ට නිරාවරණය වීම අඩු කිරීම මඟින් සමස්ත මූල්‍ය ස්ථාවරත්වය වැඩි දියුණු කරයි. යෝජිත අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් එහි ශක්‍යතාව ශක්තිමත් කරන අතර, ශ්‍රී ලංකාවට සාර්ව ආර්ථික කම්පනවලට ඔරොත්තු දිය හැකි වීමත් හදිසි මූල්‍ය අර්බුද වළක්වා ගත හැකි වීමත් සහතික කරයි. ඊට අමතරව, ඒකාබද්ධ රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය සහ ආර්ථික වර්ධන ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කිරීම ණය තිරකාරත්වය පවත්වා ගැනීමට සහාය වන අතර, ආයතනික ශක්තිමත් කිරීම සහ දේශපාලන කැපවීම උපායමාර්ගයේ දිගුකාලීන සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ඉදිරි වසරවලදී ශ්‍රී ලංකාව සිය ණය අභියෝග සාර්ථකව ජය ගන්නා අතර, තම ණය පිළිබඳ විචක්ෂණශීලී කළමනාකරණයක් සාක්ෂාත් කර ගනු ඇත.

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම -2025

අන්තර්ගතය

1. හැඳින්වීම 1
2. 2025 වර්ෂයේ දළ මූල්‍ය අවශ්‍යතා 1
3. විදේශීය මූල්‍යයනය 2
4. දේශීය මූල්‍යනය 2
5. 2025 වර්ෂය සඳහා ණය ගැනීමේ උපායමාර්ගය 3
6. යෝජිත ණය ගැනීමේ සංයුතිය 3
7. අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම 4
8. නිගමනය 4

වගු සටහන

වගුව 1: දළ මූල්‍ය අවශ්‍යතා - 2025 2

වගුව 2: යෝජිත ණය ගැනීමේ සංයුතිය -2025 4

වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම -2025

1. හැඳින්වීම

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ 2024 දෙසැම්බර් 02 වැනි දින පිහිටුවන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින්, සලකනු ලබන වර්ෂයෙහි විසර්ජන පනතට අනුකූලව සමස්ත ණය ගැනීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා සෑම මූල්‍ය වර්ෂයකටම අදාළ වන පරිදි, ණය ගැනීමේ සැලැස්මක් (වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම) සකස් කළ යුතුය. එම ණය ගැනීමේ සැලැස්ම අවම වශයෙන් අර්ධ වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය.

2025 වර්ෂය සඳහා වන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම (ABP) රජයේ ණය ගැනීමේ උපාය මාර්ගය සහ යෝජිත ණය ගැනීමේ සංයුතිය ගෙනහැර දක්වන අතර, එමඟින් ණය ගැනීමේ පිරිවැය අවම කිරීම සහතික කරමින් සහ ණය ගැනීම සම්බන්ධ අවදානම් කළමනාකරණය කරමින් වසර තුළ රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරයි.

මෙම සැලැස්ම, 2025-2029 වර්ෂ සඳහා වන මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයට (MTDS) සහ 2025-2029 වර්ෂ සඳහා වන මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට (MTFF) අනුකූල වන ලෙස සකසා ඇත.

2. 2025 වර්ෂයේ දළ මූල්‍ය අවශ්‍යතා

2025 වර්ෂයේ දී, රජයේ මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 8,835ක් වන අතර, එය බදු සහ බදු නොවන ආදායම්, ප්‍රදාන සහ ණය මඟින් මූල්‍යනය කිරීමට නියමිතය. පුරෝකථනය කර ඇති ආදායම් සහ ප්‍රදාන රුපියල් බිලියන 5,042ක් වන බැවින් රුපියල් බිලියන 3,800ක හිඟයක් පවතී. මෙම හිඟය, පිළිවෙලින් රුපියල් බිලියන 700ක් සහ රුපියල් බිලියන 3,100ක් වශයෙන්, විදේශීය සහ දේශීය ණය ගැනීම් හරහා මූල්‍යකරණය කිරීමට නියමිතය (වගුව 1 බලන්න).

රුපියල් බිලියන 700ක දළ විදේශීය ණය, දැනටමත් ගිවිසුම්ගත වී ඇති විදේශීය ණයවල පුරෝකථනය කරන ලද ප්‍රතිලබ්ධීන් සහ බහුපාර්ශවික හා ද්වීපාර්ශවික ණය දෙන ආයතනවලින් ලබා ගැනීමට නියමිත නව ණය ගැනීම්වලින් සමන්විත වන අතර, රුපියල් බිලියන 3,100ක දළ දේශීය ණය, 2025 වර්ෂයේ දී රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම හරහා දේශීය වෙළඳපළෙන් රැස්කිරීමට නියමිතය. දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 4,000කි.

වගුව 1: දළ මූල්‍ය අවශ්‍යතා - 2025

	2025 ඇස්තමේන්තුව රු. බිලියන	
ප්‍රාථමික වියදම		**4,285**
පුනරාවර්තන වියදම්	2,970	
ප්‍රාග්ධන වියදම්	1,315	
රාජ්‍ය ණය සේවාකරණය		**4,550**
ණය පොලී ගෙවීම	2,950	
ණය වාරික ආපසු ගෙවීම	1,600	
සමස්ත වියදම		**8,835**
සමස්ත ආදායම		**5,042**
දළ මූල්‍යන අවශ්‍යතාවය		**3,800**
දේශීය මූල්‍යයනය	3,100	
විදේශීය මූල්‍යයනය	700	
ණය ගැනීමේ සීමාව*		**4,000**

මූලාශ්‍රය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**අන්තිකාරම් ගිණුම් මෙහෙයුම් හා රජයේ සුරැකුම්පත්වල පොත්/මුදල් අගයන්හි ගැලපීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් වේ.*

3. විදේශීය මූල්‍යයනය

2025 ජාතික අයවැය මූල්‍යනය කිරීම සඳහා 2025 වර්ෂයේ දී රුපියල් බිලියන 700ක දළ විදේශීය මූල්‍යයනයක් (GEF) ලබා ගැනීමට රජය අදහස් කරයි (වගුව 1). බහුපාර්ශවීය සහ ද්විපාර්ශවීය ණයදෙන ආයතන සමඟ දැනටමත් ගිවිසුම් ගතවී ඇති විදේශීය ණය මඟින් රුපියල් බිලියන 277ක් ප්‍රතිලබ්ධි වනු ඇති බව රජය අපේක්ෂා කරයි. රුපියල් බිලියන 115.4ක් බහු පාර්ශවීය හා ද්විපාර්ශවීය ණය හිමියන්ගෙන් නව ණය ලෙස ගිවිසුම්ගත වීමට සැලසුම් කරන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි 4,5 සහ 6 අදියරයන් යටතේ රුපියල් බිලියන 307.6ක් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

4. දේශීය මූල්‍යනය

2025 මූල්‍ය වර්ෂය සඳහා දළ දේශීය මූල්‍යයන අවශ්‍යතාවය රුපියල් බිලියන 3,100ක් ලෙස පුරෝකථනය කර ඇත. ප්‍රසිද්ධ වෙන්දේසියේ රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම මඟින් දේශීය මූල්‍යයනයන් රැස්කිරීම සිදු කරයි. රජයේ බැඳුම්කර, වර්ෂය පුරා නිකුත් කිරීමට නියමිත මධ්‍ය කාලීන හා දිගු කාලීන දේශීය ණය උපකරණවලින් සමන්විත වේ. අර්පණ කාලසීමාවන් වසර-2, වසර-3, වසර-5, වසර-7, වසර-10 සහ වසර-15 ලෙස වේ. භාණ්ඩාගාර බිල්පත් එක් වසරක් දක්වා කල් පිරීමේ කාලයක් සහිත කෙටි කාලීන ණය උපකරණවලින් සමන්විත වේ. මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයෙහි සඳහන් පරිදි, රුපියල් බිලියන 2,170ක භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් බිලියන 930ක වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට අපේක්ෂා කරයි. 2025 වර්ෂය සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ වෙන්දේසි දින දර්ශනය, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කර

ප්‍රකාශයට පත් කරනු ඇත. මෙම වෙන්දේසි දින දර්ශනය, වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම සහ 2025 මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණ පාදක කරගනිමින් සකසනු ඇත.


5. 2025 වර්ෂය සඳහා ණය ගැනීමේ උපායමාර්ගය

2025 වර්ෂය සඳහා අවශ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආදී දේශීය මූල්‍යයන මූලාශ්‍ර වැඩි වශයෙන් භාවිතා කරමින්, දේශීය මූල්‍යකරණයට නැඹුරු ණය ගැනීමේ උපායමාර්ගික ප්‍රවේශයක් වෙත යොමු වේ. මෙම උපායමාර්ගයෙහි අරමුණු පහත පරිදි වේ.

- දළ දේශීය නිෂ්පාදිතයට ණය අනුපාතය අඩු කිරීම සහ ණය තිරසාරභාවය සහතික කිරීම
- පොලී අනුපාත, ප්‍රතිමූල්‍යකරණය සහ විදේශ විනිමය විචලනයන්ට අදාළ අවදානම් කළමනාකරණය අතරතුර ණය ගැනීමේ පිරිවැය අවම කිරීම.
- ණය තොගය ඒකරාශී වීමට විසඳුමක් වශයෙන්, ප්‍රතිමූල්‍යකරණ අවදානම් අඩු කිරීම සහ දිගු කාලීන ණය අනුපාතය වැඩි කිරීම සඳහා ණය කල්පිරීමේ පැතිකඩ පුළුල් කිරීම.
- සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන මූලාශ්‍ර ඇතුළත් කිරීම සඳහා මූල්‍යකරණ මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම.
- සහනදායී නොවන නියමයන් සහ කොන්දේසි සහිත විදේශ වාණිජ ණය ගැනීම් අඩු කිරීම

6. යෝජිත ණය ගැනීමේ සංයුතිය

මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයට අනුකූලව, සමස්ත වාර්ෂික ණය ගැනීමේ ප්‍රතිශතයක් ලෙස, එක් එක් ණය උපකරණයේ උපරිම සීමාව පහත වගුවේ දක්වා ඇත.



වගුව 2: යෝජිත ණය ගැනීමේ සංයුතිය -2025

මුළු ණය ගැනීමෙන් 80% ක් වන දේශීය ණය ගැනීම් වලින්;	මුළු ණය ගැනීමෙන් 20% ක් වන විදේශීය ණය ගැනීම් වලින්;
භාණ්ඩාගාර බිල්පත් 70%	බහුපාර්ශ්වික ස්ථාවර 45%
භාණ්ඩාගාර බැඳුම්කර 30%	ද්විපාර්ශ්වික ස්ථාවර 25%
	ද්විපාර්ශ්වික පාවෙන 10%
	අපනයන ණය ස්ථාවර 10%
	බහුපාර්ශ්වික පාවෙන 10%

7. අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම

2025 වර්ෂය තුළ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම රජය විසින් අධීක්ෂණය කරනු ඇති අතර, ඉලක්ක සපුරා ගැනීම සහ අවශ්‍ය ගැලපීම් සිදු කිරීම සහතික කිරීම සඳහා කාර්තුමය සමාලෝචන සිදු කරනු ඇත.

8. නිගමනය

2025 වර්ෂය සඳහා වන වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම (ABP) මඟින් ණය තිරසාරභාවය සහතික කරමින් රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයක් ඉදිරිපත් කරයි. භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර හරහා දේශීය මූල්‍යයනය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සහ සහනදායී නොවන විදේශ ණය ගැනීම් අවම කිරීමෙන්, දළ දේශීය නිෂ්පාදිතයට ණය අනුපාතය අඩු කිරීම, මෙම සැලැස්මේ අරමුණ වේ. එමගින් බාහිර අවදානම් අවම කිරීම සඳහා බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ස්ථාවර ණය සහ ස්වෛරී බැඳුම්කර ඇතුළු මූල්‍ය ප්‍රභවයන් විවිධාංගීකරණය කරයි. කාර්තුමය වශයෙන් අධීක්ෂණය කිරීම සහ ණය ගැනීමේ පිරිවැය ප්‍රශස්ත කිරීමට දායක වීම මගින් වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම, මූල්‍ය ස්ථාවරත්වය සහ අවදානම් කළමනාකරණයට සහාය වෙමින් දිගුකාලීන ආර්ථික ශක්තිමත්භාවය වැඩි කරනු ඇත.